*සැ. යු.-* 2022.06.03 දින පළ වූ අංක 2283 *ගැසට් පත්‍රයේ* I : II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,284 - 2022 ජුනි මස 10 වැනි සිකුරාදා - 2022.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 986 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

සැ. යු. - (i) පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූලි මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජුනි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය

### ඌව පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ රියදුරු පුහුණු පාසලේ ගාස්තු ගැසට් පත්‍රයේ පළ කිරීමට සමගාමීව සියලු පුරවැසියන්ගේ දැන ගැනීම පිණිස ප්‍රදර්ශනය කිරීම

2001 අංක 01 දරන ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ හා 2019 අංක 02 දරන සංශෝධිත ඌව පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ i කොටස 07 (ආ) වගන්ති ප්‍රකාරව සහ ii කොටස 20 වන වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සහ අංක 6/ආ/6/1 දරන 2022.06.01 දිනැති ලිපියෙන් ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යංශ ලේකම්තුමන් සඳහන් කර ඇති පරිදි ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක 1/11/3/9-1 දරන 2022.05.24 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියද මෙයට හිමි වී ඇත. ඌව පළාත් ප්‍රවාහන සේවා අධිකාරි ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අංක UTA/DBD/2021/03/10 යටතේ 2021.12.15 දිනැතිව යොමු කළ යෝජනාවට ලබා දුන් අනුමැතිය පරිදි මෙයට අමුණා ඇති උපලේඛනයේ සඳහන් වාහන පන්ති සඳහා අය කරනු ලබන ගාස්තු ඌව පළාත් රියදුරු පුහුණු පාසලේ කටයුතුවල දී මින් ඉදිරියට ක්‍රියාත්මක වන බව සියලුම පුරවැසියන්ගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරමි.

කේ. සුසිල් කුමාර,
සභාපති,
ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය.

### උපලේඛනය

01. පුහුණු අයදුම්කරුවන් සඳහා :

| *වාහන වර්ගය* | *වාහන පන්තිය* | *ගෙවිය යුතු ගාස්තුව රු. ශත* |
|---|---|---|
| යතුරු පැදි | [A] | 5,250 0 |
| ත්‍රිරෝද රථ | [B1] | 6,250 0 |
| වෑන් රථ | [B] | 8,950 0 |
| ත්‍රිරෝද/යතුරුපැදි | [B1,A] | 8,950 0 |
| වෑන් රථ/යතුරුපැදි | [B,A] | 11,950 0 |
| ත්‍රිරෝද රථ/ වෑන් රථ | [B1,B] | 12,950 0 |
| යතුරු පැදි/ත්‍රිරෝද රථ/වෑන් රථ | [A,B1,B] | 15,300 0 |

02. නුපුහුණු අයදුම්කරුවන් සඳහා :

| *වාහන වර්ගය* | *වාහන පන්තිය* | *ගෙවිය යුතු ගාස්තුව රු. ශත* |
|---|---|---|
| යතුරු පැදි | [A] | 12,500 0 |
| ත්‍රිරෝද රථ | [B1] | 12,500 0 |
| වෑන් රථ | [B] | 16,650 0 |
| ත්‍රිරෝද/යතුරුපැදි | [B1,A] | 23,500 0 |
| වෑන් රථ/යතුරුපැදි | [B,A] | 28,600 0 |
| ත්‍රිරෝද රථ/ වෑන් රථ | [B1,B] | 28,150 0 |
| යතුරු පැදි/ත්‍රිරෝද රථ/වෑන් රථ | [A,B1,B] | 37,650 0 |

03. වෙනත් පුහුණු අවස්ථා :

| වාහන වර්ගය | වාහන පන්තිය | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|---|
| යතුරු පැදි | [A] | පුහුණු | පුහුණු | නුපුහුණු | පුහුණු | නුපුහුණු | නුපුහුණු |
| ත්‍රිරෝද රථ | [B1] | පුහුණු | නුපුහුණු | පුහුණු | - | පුහුණු | නුපුහුණු |
| වෑන් රථ | [B] | නුපුහුණු | නුපුහුණු | නුපුහුණු | නුපුහුණු | - | පුහුණු |
| අයකරනු ලබන ගාස්තුව | | රු. 22,000 0 | රු. 31,000 0 | රු. 31,000 0 | රු. 15,000 0 | රු. 14,000 0 | රු. 24,000 0 |

ඩබ්. එම්. එන්. බණ්ඩාර,
සාමාන්‍යාධිකාරී,
ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය.

06-152

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.